**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – DECEMBER 2017
ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2017 දෙසැම්බර්

BUDDHIST PHILOSOPHY - I / බෞද්ධ දර්ශනය I - (BPG I)
(ආචාර විද්‍යාව හා මනෝවිද්‍යාව)

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

## I - කොටස

1. ආචාර විද්‍යා අධ්‍යයනයේ ස්වරූපය හඳුන්වා දී ඒ අනුව බුදුසමය ඇසුරින් ආචාර විද්‍යා අධ්‍යයනයක යෙදීමේ අර්ථාන්විත බව සාකච්ඡා කරන්න.

2. "බෞද්ධ ප්‍රතිපදාවේ අරමුණ පුද්ගලයාගේ සදාචාර පාරප්‍රාප්තියයි." මේ අදහස සාකච්ඡා කරන්න.

3. බෞද්ධ ආචාරධර්මය තුළ ශීලයට හිමි වැදගත්කම පැහැදිලි කරන්න.

4. බෞද්ධ හේතුඵලවාදයේ ඇති ආචාර විද්‍යාත්මක පදනම පැහැදිලි කරන්න.

5. බෞද්ධ නිර්වාණයත් සදාචාරයත් අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.

## II - කොටස

6. 'මූලික පෙළඹවීම්' පිළිබඳ බෞද්ධ මතය සහ ෆ්‍රොයිඩ්ගේ (Freud) මතය සසඳන්න.

අනෙක් පිටුවට ...

7. "බෞද්ධ චතුරාර්‍ය සත්‍යය ප්‍රධාන වශයෙන් ම අදාළ වන්නේ මිනිස් ජීවිතය පිළිබඳ මනෝවිද්‍යාත්මක විග්‍රහයකට ය." සාකච්ඡා කරන්න.

8. චිත්ත වේග හසුරුවා ගැනීම සඳහා බුදුසමයෙහි දැක්වෙන මනෝවිද්‍යාත්මක ක්‍රමෝපායයන් විමසන්න.

9. පෞරුෂ වර්ධනය සඳහා කොතෙක් දුරට බෞද්ධ භාවනා ක්‍රම භාවිතා කළ හැකිදැයි පරීක්ෂා කරන්න.

10. මානසික අසහනය දුරු කිරීම සඳහා බුද්ධ දේශනාවන්හි මනෝවිද්‍යාත්මක වැදගත්කම සූත්‍ර දේශනා ඇසුරින් පරීක්ෂා කරන්න.

==========

**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – DECEMBER 2017
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2017 දෙසැම්බර්

BUDDHIST PHILOSOPHY - II / බෞද්ධ දර්ශනය- II - (BPG - 2)
(බෞද්ධ දර්ශන ඉතිහාසය, තුලනය හා භාවිතය)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි)

---

1. සමකාලීන ආගමික හා දර්ශනික ඉගැන්වීම් විශ්ලේෂණය කොට බෞද්ධ දර්ශනය සමාජයට දායාද කළ නව චින්තනය පහදා දෙන්න.

2. බුද්ධ ධර්මය ගැන වුවත් ආධානග්‍රාහී නොවිය යුතු යැයි බුදුදහම අනතුරු අඟවන්නේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.

3. "බුදු දහමේ ඉගැන්වෙන සියළු ගණයේ අධ්‍යාත්මික අභිවෘද්ධීන් අත්දැකීම පිණිස මිස අන්ධ විශ්වාසය පිණිස නොවේ." සාකච්ඡා කරන්න.

4. සියල්ල සිදුවන්නේ පෙර කර්මය නිසාය යන මතය බුදුදහම ප්‍රතික්ෂප කරන්නේ නිසාදැයි සාකච්ඡා කරන්න.

5. ලෝක සංකල්පය පිළිබඳ බෞද්ධ අර්ථකථනය විචාරපූර්වකව විමසන්න.

6. බුද්ධ ශාසනයේ දීර්ඝකාලීන පැවැත්ම පිණිස බෞද්ධ සංගායනාවන්හි දයකත්වය සාකච්ඡා කරන්න.

7. "තර්කානුකූලව හා කාලානුක්‍රම වශයෙන් අභිධර්ම පිටකය සකස්වුයේ අනෙක් පිටක දෙකට පසුවය." විචාරයට ලක්කරන්න.

අනෙක් පිටුවට ...

8. දෙවැනි ධර්ම සංගායනාවෙන් පසුව බිහිවූ විවිධ නිකායාන්තරික මතවාද හා දර්ශන සම්ප්‍රදා පිළිබඳ විමසීමක් කරන්න.

9. මාධ්‍යමක දර්ශනය යනු සමකාලීන අන්තවාදී දෘෂ්ටි පිළිබඳව දැක්වූ විචාරපූර්වක ප්‍රතිචාරයක්දැයි සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>හතරකට</u> කෙටි සටහන් ලියන්න.

I. ත්‍රිකාය
II. ආලය විඥානය
III. නිප්පරියාය දෙසනා
IV. බාහ්‍යාර්ථ අනුමෙයවාදය
V. අන්තරාභව
VI. පරමාර්ථසත්‍යය

=========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – DECEMBER 2017

ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2017 දෙසැම්බර්

BUDDHIST PHILOSOPHY - III / බෞද්ධ දර්ශනය- III - BPG - 3
(පාරභෞතික විද්‍යාව හා ඥානමීමාංසාව)

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි.)

## I - කොටස

1. බුදුරදුන් අධිකාරය ඥාන මූලාශ්‍රයක් ලෙස ප්‍රතික්ෂේප කළේ ඇයිදැයි සාකච්ඡා කරන්න.

2. දෙවියන් වහන්සේ පිළිබඳ සංකල්පය බුදුසමයෙහි විවේචනය කෙරෙන අයුරු පැහැදිලි කරන්න.

3. සංජානනය පිළිබඳ බෞද්ධ විවරණයෙහිලා ඉන්ද්‍රිය බද්ධ විෂය මෙන් ම අතීන්ද්‍රිය විෂය ද ඇතුළත් කොට ඇත්තේ කවර හෙයින් දයි පැහැදිලි කරන්න.

4. ස්වච්ඡන්දයට හා නියතිවාදයට බුදුදහමේ කිසියම් තැනක් තිබේ දැයි මූලික බෞද්ධ සූත්‍ර ඇසුරින් සාකච්ඡා කරන්න.

5. බුදුසමයේ ඉගැන්වෙන නිර්වාණය පාරභෞතික යථාර්ථයක් ලෙස සැලකිය හැකිද? සාකච්ඡා කරන්න.

## II - කොටස

6. "බුදුන් වහන්සේ සම්ප්‍රදායවාදියෙකු වත් (අනුස්සවිකා) තාර්කිකවාදියෙකු වත් (තක්කී / වීමංසී) නොවෙති." පැහැදිලි කරන්න.

අනෙක් පිටුවට ...

7. අධිකාරය සප්‍රමාණ ඥානය සඳහා නිශ්චිත හා විශ්වාසනීය මාර්ගයක් ලෙස බුදුසමය විසින් ප්‍රතික්ෂේප කිරීමේ හේතු පැහැදිලි කරන්න.

8. අනාත්ම ධර්මය තහවුරු කරමින් බුදුසමය පුනරුත්පත්තිය විවරණය කරන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න.

9. බුදුරදුන් විසින් ඇතැම් දාර්ශනික ප්‍රශ්න අව්‍යාකෘත වශයෙන් වර්ගීකරණය කොට දක්වීමට හේතු විමසන්න.

10. මිනිසා තමාගේ ප්‍රපංචයනට ම ගොදුරක් වන ආකාරය විචාර පූර්වකව විමසන්න.

============